සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

AL/2020/21/S-1

සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education, Sabaragamuwa province

**සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Sabaragamuwa province**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020**
**General Certificate of Education (Adv.Level) Examination, 2020**

**ආර්ථික විද්‍යාව I**
**Economics I**

**21** **S** **I**

**12 ශ්‍රේණිය - තෙවන වාරය**

**පැය දෙකයි**
**Two hours**

**උපදෙස් ඃ**

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ** පිළිතුර තෝරා ගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි යොදා දක්වන්න.**

---

1. පහත සඳහන් ප්‍රකාශන අතුරින් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශනයක් වනුයේ කවරක්ද?

    (i) පසුගිය වසරේදී රබර් මිල 10% කින් පහළ වැටුණි.
    (ii) පසුගිය වසරේදී විරැකියාව ශ්‍රම හමුදාවෙන් 5.8% ක් වූයේය.
    (iii) පසුගිය වසරේදී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 7% කින් ඉහළ ගියේය.
    (iv) පසුගිය වසරේදී පොදු මිල මට්ටම 4% කින් වැඩි වූයේය.
    (v) පසුගිය වසරේදී රජයේ බදු අයභාරය 8% කින් අඩු විය.

2. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අභිමතානුරූපී ප්‍රකාශයක් වනුයේ කවරක්ද?

    (i) ඉන්ධන මිල ඉහළ යාම විදුලි මෝටර් රථ සඳහා ඉල්ලුම ධෛර්යමත් කරන්නේ ය.
    (ii) ආදායම වැඩි වන්නේ නම් සුඛෝපභෝගී භාණ්ඩ අලෙවිය පහළ වැටෙන්නේ ය.
    (iii) ලැප්ටොප් මිල පහළ වැටෙන විට මිනිස්සු ඒවා වැඩියෙන් මිල දී ගනිති.
    (iv) නිවාස හිමියන් අය කරන ගෙවල් කුලී රජය විසින් පාලනය කළ යුතු ය.
    (v) භාණ්ඩයක ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය, එහි මිල වෙනස්වීම සමග ප්‍රතිවිරුද්ධ ලෙස සම්බන්ධව පවතී.

3. පහත දැක්වෙන දෑ අතුරින් ආර්ථික භාණ්ඩයක ලක්ෂණ නිවැරදිව පිළිබිඹු කරන පිළිතුර තෝරන්න,

    A- නිෂ්පාදන පිරිවැයක් පැවතීම
    B- ආවස්ථික පිරිවැයක් පැවතීම
    C- පාරිභෝගිකයා විසින් වියදමක් දැරීම
    D- අඩුවන ආන්තික පිරිවැයක් පැවතීම

    i. A සහ B ය    ii. A සහ C ය    iii. A, B සහ C ය
    iv. A, C සහ D ය    v. B, C සහ D ය

4. නිෂ්පාදන සාධකයක් ලෙස භූමියට උදාහරණයක් වශයෙන් පහත සඳහන් කවරක් දැක්විය හැකි ද?

(i) මාගම්පුර වරාය. (ii) දක්ෂිණ අධිවේගී මාර්ගය. (iii) වික්ටෝරියා වේල්ල.
(iv) අඹේවෙල කිරි ගොවිපොල. (v) පාසිකුඩා වෙරළ තීරය.

5. ආර්ථික විද්‍යාවේ "හිඟකම" සංකල්පයෙන් අදහස් කරනුයේ,


(i) සමාජය තමන් සතු සියලු සම්පත් කාර්යක්ෂමව උපයෝජනය නොකරන තත්ත්වයකි.
(ii) පවත්නා සම්පත්වලින් මිනිසුන්ගේ වුවමනා කිසිසේත් සපුරාගත නොහැකි තත්ත්වයකි.
(iii) සෑම සමාජයකම කිසියම් සාමාජික පිරිසක් දිළින්දන් ලෙස ජීවත්වන තත්ත්වයකි.
(iv) සමාජීය වශයෙන් හිතකර භාණ්ඩ හා සේවා නිපදවනවා වෙනුවට නොවැදගත් භාණ්ඩ හා සේවා වුවමනාවටත් වඩා නිපදවන තත්ත්වයකි.
(v) නිෂ්පාදනය කාර්යක්ෂම වුවත් බෙදාහැරීම අකාර්යක්ෂමව පවතින තත්ත්වයකි.

6. වෙළෙඳපොළ ආර්ථිකයක පුද්ගල ආදායම තීරණය වනුයේ,


(i) රජයේ සාධක මිල ප්‍රතිපත්තිය සහ පිහිටාධාර මතය.
(ii) සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ පෞද්ගලික ආදායම් බදු මතය.
(iii) සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ රජයේ වැටුප් ප්‍රතිපත්තිය මතය.
(iv) සාධක වෙළෙඳපොළේ සාධක සඳහා පැවති මිල සහ එම මිලට හුවමාරුවන ප්‍රමාණය මතය.
(v) දේපල හිමිකම සහ සාධක වෙළෙඳපොළේ සාධක මිල මතය.

7. රූප සටහනෙහි දැක්වෙන්නේ කිසියම් රටක නිෂ්පාදන හැකියා වක්‍රයකි. ආවස්ථික පිරිවැයකින් තොර නිමැවුමෙහි වෙනසක් පෙන්නුම් කරනුයේ,

(i) Y සිට Z දක්වා ය.
(ii) V සිට W දක්වා ය.
(iii) W සිට X දක්වා ය.
(iv) X සිට W දක්වා ය.
(v) U සිට V දක්වා ය.




8. A ලක්ෂ්‍යය නිෂ්පාදනයෙහි නිරතව සිටින ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පහත රූප සටහන පෙන්නුම් කරයි.




Y භාණ්ඩයෙන් නිෂ්පාදනය කරනු ලබන නිමැවුම් ප්‍රමාණය වෙනුවෙන් X භාණ්ඩයෙන් කැප කරන ලද නිමැවුම් ප්‍රමාණය කොපමණ ද?

(i) 100
(ii) 200
(iii) 300
(iv) 400
(v) 500

9. ඉල්ලුම් වක්‍රයක් ඇඳීමේදී ස්ථාවරව පවතින්නේ නැතැයි සලකනුයේ පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?

(i) පාරිභෝගිකයන්ගේ මුදල් ආදායම. (ii) පාරිභෝගිකයන්ගේ අභිරුචිය.
(iii) එම භාණ්ඩයේ මිල. (iv) ආදේශක භාණ්ඩවල මිල.
(vi) අනුපූරක භාණ්ඩවල මිල.

10. මිල වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය යනු,

(i) මූර්ත ආදායම නොවෙනස්ව තිබිය දී, නිරපේක්ෂ මිල වෙනස් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හටගන්නා වෙනස් වීමය.
(ii) මුදල් ආදායම නොවෙනස්ව තිබිය දී, සාපේක්ෂ මිල වෙනස් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හටගන්නා වෙනස් වීමය.
(iii) උපයෝගීතාව නොවෙනස්ව තිබිය දී, සාපේක්ෂ මිල වෙනස් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හටගන්නා වෙනස් වීමය.
(iv) සාපේක්ෂ මිල නොවෙනස්ව තිබිය දී, මූර්ත ආදායම වෙනස් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හටගන්නා වෙනස් වීමය.
(v) භාණ්ඩ දෙකක් හෝ වැඩි ගණනක සාපේක්ෂ මිලයන් වෙනස් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ හටගන්නා වෙනස් වීමය.

11. බෝල්පොයින්ට් පෑන් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය - 3.0 කි. බෝල්පොයින්ට් පෑනක මිල රුපියල් 25ක් වන විට පෑන් 300ක් ඉල්ලුම් කරනු ලැබේ. පෑනක මිල රුපියල් 20කට අඩුවුවහොත්, කොපමණ ප්‍රමාණයක් ඉල්ලුම් කරනු ලැබේ ද?

(i) 900 (ii) 630 (iii) 560 (iv) 480 (v) 180

12. කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් සමීකරණය පහත දී ඇත.

$$Qd = 200 - 8P$$

මෙම භාණ්ඩයේ මිල රු. 10ක් වන විට ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ වටිනාකම කීය ද?

(i) - 0.6 කි. (ii) - 0.66 කි. (iii) - 0.06 කි. (iv) + 0.06 කි. (v) + 0.66 කි.

13. “X” නැමැති භාණ්ඩය සඳහා ආදායම් ඉල්ලුම් නම්‍යතාවය ඍණ අගයක් ද, “X” හා “Y” යන භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාව ඍණ අගයක් ද වේ නම් “X” භාණ්ඩය පිළිබඳව කවර කරුණක් නිවැරදි වේ ද?

(i) “X” සාමාන්‍ය භාණ්ඩයක්වන අතර, එය “Y” භාණ්ඩය සඳහා ආදේශකයක් ද වේ.
(ii) “X” සාමාන්‍ය භාණ්ඩයක්වන අතර, එය “Y” භාණ්ඩය සමඟ අනුපූරක සම්බන්ධයක් දක්වයි.
(iii) “X” බාල භාණ්ඩයක්වන අතර, එය “Y” භාණ්ඩය සඳහා ආදේශකයක් ද වේ.
(iv) “X” සාමාන්‍ය භාණ්ඩයක්වන අතර, එය “Y” භාණ්ඩය සමඟ අනුපූරක සම්බන්ධයක් දක්වයි.
(v) “X” සාමාන්‍ය භාණ්ඩයක්වන අතර, “Y” බාල භාණ්ඩයක් වේ.

14. කිසියම් පුද්ගලයෙක් ආදායම ඉහළයන විට කිරි පිටි සඳහා කරන ලද ඉල්ලුම වැඩි කරයි නම්, කිරි පිටි

(i) බාල භාණ්ඩයකට උදාහරණයක් වේ. (ii) ආර්ථික නොවන භාණ්ඩයකට උදාහරණයක් වේ.
(iii) ගිෆන් භාණ්ඩයකට උදාහරණයක් වේ. (iv) පොදු භාණ්ඩයකට උදාහරණයක් වේ.
(vi) සාමාන්‍ය භාණ්ඩයකට උදාහරණයක් වේ.

15. සැපයුම් කරුවකු තම භාණ්ඩයේ මිල 10% කින් ඉහළ දැමීම මඟින් අයභාරය ඉහළ දමා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම අරමුණ ඉටු කර ගැනීමට නම් වඩාත් යෝග්‍ය වන්නේ,

(i) මිල ඉල්ලුම් නම්‍යතාවය එකට වඩා අඩු විය යුතු වීම ය.
(ii) මිල ඉල්ලුම් නම්‍යතාවය එකට වඩා වැඩි විය යුතු වීම ය.
(iii) මිල ඉල්ලුම් නම්‍යතාවය එකට සමාන විය යුතු වීම ය.
(iv) සැපයුමෙහි මිල නම්‍යතාවය ශූන්‍ය විය යුතු වීමය.
(v) සැපයුමෙහි මිල නම්‍යතාවය පූර්ණ නම්‍ය විය යුතු වීමය.

16. ජංගම දුරකතන සමාගමක් හඳුන්වා දුන් “අභිමාන” නම් විශේෂ පැකේජය සඳහා ග්‍රාහකයෝ මිලියනයක් සිටිති. මාසික ගාස්තුව රුපියල් 100ක් වන එම පැකේජයෙහි මිල ඉල්ලුම් නම්‍යතාවය -4.0ක් ලෙස සමාගම විසින් ඇස්තමේන්තු කොට ඇත. “අභිමාන” පැකේජයේ මාසික ගාස්තුව රුපියල් 25කින් අඩු කරනු ලැබුවහොත් සමාගමේ මුලු අයභාරය,

(i) රුපියල් මිලියන 100කින් ඉහළ නගී. (ii) රුපියල් මිලියන 75කින් ඉහළ නගී.
(iii) රුපියල් මිලියන 50කින් ඉහළ නගී. (iv) රුපියල් මිලියන 50කින් පහළ වැටේ.
(vi) රුපියල් මිලියන 100කින් පහළ වැටේ.


17. එක්තරා නිෂ්පාදන ආයතනයක් විසින් නිපදවනු ලබන භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවය, -0.8 ක් වේ. නිෂ්පාදන ආයතනය විසින් එම භාණ්ඩයේ මිල ඉහළ නංවනු ලැබුවහොත් ආයතනයේ අයභාරය,

(i) ඉහළ නගී. (ii) පහළ බසී. (iii) නොවෙනස්ව පවතී.
(iv) 8% කට වඩා වැඩි ප්‍රමාණයකින් පහළ බසී. (v) 8% කට වඩා අඩු ප්‍රමාණයකින් පහළ බසී.

18. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී සහල් මිල අඩු වූ විට, සහල් සඳහා තමන් විසින් වැය කරනු ලැබූ මුලු වියදම නොවෙනස්ව පැවති බව කිසියම් පාරිභෝගිකයෙක් නිරීක්ෂණය කරයි. මෙම මිල වෙනස් වීම සම්බන්ධයෙන් එළඹිය හැකි නිවැරදි නිගමනය වනුයේ කුමක් ද?

(i) මෙම පාරිභෝගිකයා සහල්, බාල භාණ්ඩයක් ලෙස සලකයි.
(ii) මිල වෙනස්වීමට සංවේදීව සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම වැඩි වූයේය.
(iii) සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම පූර්ණ මිල නම්‍යතාවයක් පෙන්නුම් කරයි.
(iv) සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම පූර්ණ මිල අනම්‍යතාවයක් පෙන්නුම් කරයි.
(v) සහල් සඳහා පාරිභෝගිකයාගේ ඉල්ලුම ඒකීය මිල නම්‍යතාවයක් පෙන්නුම් කරයි.

19. එක්තරා භාණ්ඩයක් සඳහා අදාළ වෙළෙඳපොල ඉල්ලුම් හා සැපයුම් වක්‍ර රූප සටහනෙහි දැක්වේ.




සමතුලිත ඒකක ප්‍රමාණය මිලදී ගැනීම සඳහා පාරිභෝගිකයන් විසින් ගෙවීමට කැමති මුළු මුදල් ප්‍රමාණය රූප සටහනෙහි නිරූපණය කෙරෙන ප්‍රදේශය වන්නේ,

(i) OQEP ය. (ii) OTEQ ය. (iii) PEK ය. (iv) OKM ය. (v) OKEQ ය.

20. අදාළ භාණ්ඩය සඳහා ඇති කිට්ටුම ආදේශක භාණ්ඩවල මිල සැළකිල්ලට ගනිමින්, කිසියම් සමාගම් 5ක් නිපදවනු ලබන භාණ්ඩ සඳහා ඇති ඉල්ලුමේ හරස් මිල නම්‍යතා පහත සඳහන් වගුවේ දැක්වේ.

| සමාගම | හරස් මිල ඉල්ලුම් නම්‍යතාව |
|---|---|
| A සමාගම | + 3.0 |
| B සමාගම | + 2.5 |
| C සමාගම | + 1.0 |
| D සමාගම | + 0.8 |
| E සමාගම | + 0.2 |

මේ අනුව ඉහත සමාගම් අතුරෙන් වැඩිම වෙළෙඳපොල බලය හිමිව ඇත්තේ කවර සමාගමට ද?

(i) A සමාගමට ය. (ii) B සමාගමට ය. (iii) C සමාගමට ය. (iv) D සමාගමට ය. (v) E සමාගමට ය.


21. කිසියම් කුඩා රටක සීනි සඳහා දේශීය වෙළෙඳපොලේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පිලිවෙළින් පහත සඳහන් සමීකරණ පෙන්නුම් කරයි.

$$\mathrm{Qd} = 320 - 3\mathrm{P} \qquad \mathrm{Qs} = -80 + 2\mathrm{P}$$

තව ද එම රටේ සීනි වෙළෙඳපොළ ජාත්‍යන්තර වෙළෙඳාමට විවෘත බවත්, සීනි ඒකකයක ලෝක වෙළෙපොල මිල රු. 60ක් වන බවත් සලකන්න, විදේශ වෙළෙඳාමට විවෘතව ඇති තත්ත්වය යටතේ, වෙළෙපොලට දේශීය වශයෙන් සපයනු ලබන සීනි ප්‍රමාණය කොපමණ වේ ද?

(i) ඒකක 40 (ii) ඒකක 60 (iii) ඒකක 80 (iv) ඒකක 100 (v) ඒකක 140

22.




"X" භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොල, ඉහත රූප සටහන නිරූපණය කරයි. "X" භාණ්ඩය මත විශේෂිත බද්දක් පනවනු ලැබුව හොත්, බද්දට පසු පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදක අතිරික්තය සහ අහිමිවුනු ශුභ සාධනය පෙන්නුම් කරනුයේ පහත දැක්වෙන කවර කොටස්වලින් ද?

| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදක අතිරික්තය | අහිමිවුනු ශුභ සාධනය |
|---|---|---|---|
| (i) | A | G + F + E + H | D + E |
| (ii) | A | H | D + E |
| (iii) | A + B | G + F + E | C + D |
| (iv) | A + B + C + D | G + F + E + H | D + E |
| (v) | A + B + C + D | H + F + C | E |


23. දෙන ලද භාණ්ඩයක සැපයුම් සමීකරණය $Qs = 200 + 10P$ ලෙස දී ඇතැයි සිතන්න. මෙම භාණ්ඩය මත රු. 5 ක ඒකක බද්දක් පනවන ලදී. බද්දෙන් පසු සැපයුම් සමීකරණය වන්නේ,

(i) $Qs = 150 + 10P$ (ii) $Qs = 100 + 5P$ (iii) $Qs = 100 + 15P$
(iv) $Qs = 100 + 50P$ (v) $Qs = 500 + 50P$

24. පෙට්‍රල් සඳහා පවත්නා ඉල්ලුම අතිශයින් අනම්‍ය බවත් එහි සැපයුම අතිශයින් නම්‍ය බවත් සලකන්න. මෙම තත්ත්වය යටතේ පෙට්‍රල් මත නිෂ්පාදන බද්දක් පනවනු ලැබුවහොත් බදු බර,

(i) ඉතා විශාල වශයෙන් ගැනුම්කරුවන් විසින් දරනු ලැබේ.
(ii) ඉතා විශාල වශයෙන් විකුණුම්කරුවන් විසින් දරනු ලැබේ.
(iii) ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විසින් සමසමව දරනු ලැබේ.
(iv) මුළුමනින් ම අය බදු ගෙවන්නෝ දරති.
(v) ගැනුම්කරුවෝ හෝ විකුණුම්කරුවෝ හෝ නොදරති.


25. පවත්නා ඉල්ලුම් හා සැපයුම් තත්ත්ව යටතේ E ලක්ෂයෙහි සමතුලිතය තීරණය වූ සහල් වෙළෙඳපොලක් රූප සටහනෙහි දැක් වේ.




ආණ්ඩුව විසින් සහල් ඒකකයක් සඳහා රුපියල් $P_1$ වන උපරිම මිලක් නියම කිරීමට තීරණය කරනු ලැබුවහොත්, එමඟින් බොහෝ දුරට සිදුවිය හැකි ප්‍රතිඵලය වනුයේ, වෙළෙඳපොලෙහි,

(i) JK ප්‍රමාණයේ අතිරික්ත සහල් සැපයුමක් හට ගැනීම.
(ii) $OQ_2$ ප්‍රමාණයේ සහල් හිඟයක් හටගැනීම.
(iii) සමතුලිත මිල $OP_2$ ට වඩා ඉහළ යාමය.
(iv) $OP_1$ ට වඩා මිල පහළ වැටීම ය.
(v) JK ප්‍රමාණයේ අධි ඉල්ලුමක් සහල් සඳහා හට ගැනීම ය.

26.




ඉහත රූප සටහනෙහි දැක්වෙන්නේ කෘෂිකාර්මික භාණ්ඩයක් සඳහා අදාළ වෙළෙඳපොල ඉල්ලුම් හා සැපයුම් වක්‍රයන් ය. ආණ්ඩුව අතිරික්ත සැපයුම මිලදී ගැනීමට මැදිහත් වෙමින්, OM මිල පවත්වාගෙන යාමට මිල ආධාරක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරයි. මෙම මිල ආධාරක ප්‍රතිපත්තිය අත් හැර දැමීමට ආණ්ඩුව තීරණය කරනු ලැබුවහොත් ආණ්ඩුවේ වියදම

(i) NUT ප්‍රමාණයෙන් අඩුවේ.
(ii) NUTS ප්‍රමාණයෙන් අඩුවේ.
(iii) STQR ප්‍රමාණයෙන් අඩුවේ.
(iv) NUQR ප්‍රමාණයෙන් අඩුවේ.
(vi) PMUT ප්‍රමාණයෙන් අඩුවේ.

27. නිෂ්පාදන ක්‍රියාවලියක මහා පරිමාණ පිරිමැසුම් පවතී නම් එකඟ විය හැකි ප්‍රකාශය කුමක්ද?

(i) කෙටි කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පහළ බසී
(ii) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය පහළ බසී
(iii) සාමාන්‍ය ඵලදා වක්‍රය ක්‍රමයෙන් පහළ බසී
(iv) මුළු පිරිවැය වක්‍රය ස්ථාවර වේගයෙන් ඉහල යයි
(v) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය ඉහළ නගී

28. පූර්ණ තරඟකාරී ආයතනයක කෙටි කාලීන සැපයුම් වක්‍රය වන්නේ
(i) සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ ඉහල නඟින කොටසයි
(ii) සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ ඉහල නඟින කොටසයි
(iii) ආන්තික පිරිවැය වක්‍රයේ ඉහල නඟින කොටසයි
(iv) සාමාන්‍ය මුළු පිරිවැය අවම ලක්ෂයේ සිට ඉහල නඟින ආන්තික පිරිවැය වක්‍රය යි
(v) සාමාන්‍ය විචල්‍ය පිරිවැයේ අවම ලක්ෂයේ සිට ඉහල නඟින ආන්තික පිරිවැය වක්‍රය යි


29. පූර්ණ තරඟකාරී ආයතනයක විස්තර පහත දැක්වේ

| නිමවුම් ඒකක | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| මුළු විචල්‍ය පිරිවැය (රු) | 10 | 20 | 30 | 35 | 55 |

මෙහි ස්ථාවර පිරිවැය රු.30 කි. නිමැවුම් ඒකක 3 දී ආන්තික පිරිවැය හා සාමාන්‍ය මුළු පිරිවැය පිළිවෙලින් දැක්වෙන්නේ

(i) 20 හා 50 ය (ii) 10 හා 20 ය (iii) 10 හා 30 ය
(iv) 20 හා 60 ය (v) 30 හා 50 ය

30. පහත රූප සටහනින් පැහැදිලි කෙරෙන්නේ පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක කෙටිකාලීන සමතුලිතතාවයයි




මෙම කර්මාන්තය දිගුකාලීන වෙළෙඳපල සමතුලිතතාවය ළඟා කර ගැනීම සඳහා

(i) නව ආයතන කර්මාන්තයට ඇතුළු විය යුතුය
(ii) සමහර ආයතන කර්මාන්තයෙන් ඉවත්විය යුතුය
(iii) දැනට පවතින ආයතන ඒවායේ සැපයුම වැඩි කල යුතුය
(iv) දැනට පවතින ආයතන ප්‍රචාරණ උපක්‍රම අනුගමනය කල යුතුය
(v) දැනට පවතින ආයතන කර්මාන්තයෙන් ඉවත් නොවිය යුතුය

31. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍රය පිළිබඳ නිවැරදි වරණය තෝරන්න

| | සැපයුම් වක්‍රය | ඉල්ලුම් වක්‍රය |
|---|---|---|
| I. | නිශ්චිත නැත | පූර්ණ නම්‍ය වේ |
| II. | නම්‍ය වේ | පූර්ණ අනම්‍ය වේ |
| III. | වමේ සිට දකුණට ඉහළට බෑවුම් වේ | වමේ සිට දකුණට පහළට බෑවුම් වේ |
| IV. | දකුණේ සිට වමට ඉහළට බෑවුම් වේ | නිශ්චිත නැත |
| V. | නිශ්චිත නැත | අනම්‍ය වේ |

32. කිසියම් නිෂ්පාදන ආයතනයක් ඒකක 10 ක් නිපදවීමේ දී ස්ථාවර පිරිවැය රු. 50 ක් ද සාමාන්‍ය මුළු පිරිවැය රු. 25ක්ද විය. එක් ඒකකයක් නිපදවීමේ දී රු. 25ක ආන්තික පිරිවැයක් ද දරනු ලැබුවේ නම් එකී ඒකකය නිෂ්පාදනය කරන විට,

(i) මුළු පිරිවැය රු.250 ක් හා සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු.5 ක් වේ.
(ii) මුළු පිරිවැය රු.275 ක් හා සාමාන්‍ය පිරිවැය රු.25 ක් වේ.
(iii) මුළු ස්ථාවර පිරිවැය රු.50 ක් හා මුළු පිරිවැය රු.250 ක් වේ.
(iv) මුළු පිරිවැය රු.275 ක් හා මුළු විචල්‍ය පිරිවැය රු.200 ක් වේ.
(v) මුළු විචල්‍ය පිරිවැය රු.225 ක් වන අතර සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු.5 කි.

33. පරිමාණානුකූලඵල නීතිය යනුවෙන් අදහස් කරන්නේ,

(i) දිගුකාලයක දී විචල්‍ය පිරිවැය මත ස්ථාවර පිරිවැය වෙනස් කරගෙන යාමේදී හට ගන්නා පිරිවැසුම් ය

(ii) වැඩි වන, අඩු වන, ස්ථාවර ආන්තික ඵලදාවයි

(iii) යෙදවුම් අතිරේක ඒකකයකින් වැඩි කරන විට මුළු ඵලදාවේ සිදුවන ඉහළ යාමයි


(iv) දිගුකාලයේ දී සියලුම සාධක සමාන අනුපාතයකින් වෙනස් කරමින් නිෂ්පාදනය සිදු කරන විට නිෂ්පාදනය හැසිරෙන ආකාරයයි

(v) විචල්‍ය සාධක වෙනස් කරමින් නිෂ්පාදනයේ යෙදෙන විට හටගන්නා පිරිමැසුම් ය

34. නිවැරදි ප්‍රකාශය හදුනාගන්න

(i) කෙටි කාලයේදී ආන්තික පිරිවැය, මුළු විචල්‍ය පිරිවැය වක්‍රයේ එක් එක් ලක්ෂයේ බෑවුම මගින් ලබා ගත හැකිය
(ii) සාමාන්‍ය පිරිවැය යනු අවසාන ඒකකයේ පිරිවැයයි
(iii) දිගු කාලයේදී ද හීනවන ආන්තික ඵලදා නීතිය ක්‍රියාත්මක වේ
(iv) ස්ථාවර පිරිවැය දිගු කාලයේදී ද පවතී
(v) ආන්තික ඵලදාව උපරිම වන විට මුළු ඵලදාව ද උපරිම වේ

35. එක්තරා ආයතනයක දිගු කාලීන සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය පහත රූප සටහන මඟින් දැක්වේ




ආයතනයේ නිමැවුම $Q_0$ සිට $Q_1$ දක්වා වැඩි වන විට ක්‍රියාත්මක වනුයේ

(i) පරිමාණානුකූල නොපිරිමැසුම්ය
(ii) සියලු නිෂ්පාදන සාධකවල අකාර්යක්ෂමතාවය ඉවත් වීමයි
(iii) වැඩෙන ආන්තික ඵලදාවයි
(iv) හීනවන පරිමාණානුකූල ඵලදාවයි
(v) වැඩෙන පරිමාණානුකූල ඵලදාවයි

36. පූර්ණ තරඟකාරී ආයතනයක් ආර්ථික අලාභ ලබන තත්ත්වයකදී පමණක් දැකිය හැක්කේ,

(i) ආන්තික පිරිවැය, ආන්තික අයභාරයට සමාන වේ.
(ii) මිල, සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු වේ.
(iii) මිල, සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි වේ.
(iv) මිල, සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වේ.
(v) ඉල්ලුම් වක්‍රය ප්‍රමාණ අක්ෂයට සමාන්තර වේ.

37. පහත සඳහන් දෑ අතුරින් මෙම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය තුළට ඇතුලත් කෙරෙන සිදුවීම කුමක් ද?

(i) රාජ්‍ය ණය සදහා ගෙවන පොලිය
(ii) ආයෝජකයෙකු සමාගමක කොටස් මිලදී ගැනීමට දරණ වියදම
(iii) සේවක අර්ථසාධක අරමුදලින් සාමාජිකයෙකු විසින් නිවාස ණයක් ලබා ගැනීම
(iv) සමාගමක් විසින් නිකුත් කරන ලද බැදුම්කර සදහා ලැබුනු පොලිය
(v) විශ්‍රාමික රාජ්‍ය සේවකයෙකුට ලැබුනු විශාම වැටුප

38. දළ දේශීය නිෂ්පාදිතය

(i) දෙන ලද වර්ෂය තුල ගනුදෙනු කරනු ලැබූ මුළු භාණ්ඩ හා සේවා ප්‍රමාණයේ වටිනාකමට සමාන වේ
(ii) දෙන ලද වර්ෂය තුල මිලදී ගනු ලැබූ ව්‍යාපාරික කොටස් හෝ අලෙවිකරණ ලද බැදුම්කර හෝ එවැනි මූල්‍ය ගණුදෙනුවලින් සමන්විත වේ
(iii) ගණනය කිරීමේ දී අතරමැදි නිෂ්පාදන අදියරයන්හි දී මිලදී ගනු ලැබූ භාණ්ඩ ද ඇතුලත් කෙරේ
(iv) දෙන ලද වර්ෂයක් තුල දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලැබූ සියලුම අවසාන භාණ්ඩ හා සේවා සදහා වැය කරන ලද මුදලට සමාන වේ
(v) දෙන ලද වර්ෂය තුල නිෂ්පාදනය කරන ලද සියලුම භාණ්ඩ හා සේවාවලින් සමන්විත වේ.

39. සරල ආර්ථිකයක සමාහාර ඉතුරුම් ශ්‍රිතයේ බෑවුම අඩු වීම නිසා ඇති විය හැකි ආර්ථික ප්‍රතිවිපාක වනුයේ

(i) ගුණකයේ අගය අඩු වීම හා සමතුලිත ජාතික ආදායම අඩු වීම
(ii) ගුණකයේ අගය විශාල වීම හා සමතුලිත ජාතික ආදායම ඉහළ යාම
(iii) ගුණකයේ අගය විශාල වීම හා සමතුලිත ජාතික ආදායම අඩු වීම
(iv) ගුණකයේ අගය කුඩා වීම හා සමතුලිත ආදායම නොවෙනස්ව පැවතීම
(v) ගුණකයේ අගය හා සමතුලිත ආදායම නොවෙනස්ව පැවතීම

40. විවෘත ආර්ථිකයක සමතුලිතය පිලිබඳව පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත

අපනයන (X) 200, ආනයන (M) 500, බදු (T) 1000, රජයේ මිලදී ගැනීම් (G) 1300, ඉතුරුම් (S) 1200, මෙම ආර්ථිකයේ ආයෝජන මට්ටම (I) වන්නේ?

(i) 100 (ii) 200 (iii) 1200 (iv) 700 (v) 1100

41. සරල ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාව 0.6 කි. ස්වායත්ත ආයෝජනය රුපියල් මිලියන 100කින් වැඩි කළ විට සමතුලිත ජාතික ආදායම ප්‍රසාරණය වන්නේ,

(i) රුපියල් මිලියන 250 (ii) රුපියල් මිලියන 40 (iii) රුපියල් මිලියන 60
(iv) රුපියල් මිලියන 400 (v) රුපියල් මිලියන 20

42. සමතුලිත ජාතික ගිණුම සම්බන්ධව පහත සඳහන් ප්‍රකාශ අතරින් නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,

(i) Y + M = C + I + G
(ii) Y = C + I + G + NX
(iii) Y = C + I + G + X +M
(iv) S + T + X = I + G + M
(v) C + S + T

43. පහත දැක්වෙන ආර්ථික ක්‍රියාකාරකම් අතුරින් ආර්ථික නිෂ්පාදනයක් ලෙස දළ දේශීය නිෂ්පාදනයට ඇතුළත් අයිතමයන් කවරේද?

a. නව නිවසක් ලබා දෙන නේවාසික සේවා
b. දරුවන් රැකබලා ගැනීම හා පුහුණු කිරීම
c. ගෘහයන් තුළ පරිභෝජනය සඳහා මසුන් ඇල්ලීම හා දඩයම් කිරීම
d. නව නිවස පිරිසිදු කිරීම හා අලංකාර කිරීම

(i) A හා B (ii) B හා C (iii) A හා C (iv) A හා D (v) C හා D

44. ආදායම් ප්‍රවේශය යටතේ ජාතික ගිණුම් තක්සේරු කරන විට මූලික මිල අනුව සමස්ථ එකතු කළ අගය ලෙස සැලකෙන්නේ

(i) සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු
(ii) සේවක ආදායම් + ශුද්ධ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම
(iii) ශුද්ධ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම් + ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය
(iv) සේවක ආදායම් + ශුද්ධ මෙහෙයුම් අතිරික්තය + භාණ්ඩ හා සේවා මත ශුද්ධ බදු
(v) දළ මෙහෙයුම් අතිරික්තය + නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු + භාණ්ඩ හා සේවා මත ශුද්ධ බදු

12

45. ආර්ථිකයක් තුළ වියදම් ප්‍රවේශය යටතේ දේශීය නිෂ්පාදනය ගණනය කිරීමේදී කුටුම්භයන්ගේ සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදමට ඇතුළත් වන්නේ

(i) පෞද්ගලික පරිභෝජන වියදම සහ රජයේ පුද්ගල පරිභෝජන වියදමයි
(ii) අවසාන පරිභෝජන වියදම සහ පෞද්ගලික පරිභෝජන වියදමයි
(iii) පෞද්ගලික පරිභෝජන වියදම සහ පොදු පරිභෝජන වියදමයි
(iv) රාජ්‍ය පරිපාලන වියදම් හා ආරක්ෂණ වියදමයි
(v) පෞද්ගලික පරිභෝජන වියදම හා ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදමයි

46. සරල ආර්ථිකයක සමතුලිතයේ දී ආයෝජන ( I ) රු.මි 600 කි. ඉතුරුම් ( S ) = 0.2y වේ නම් සමතුලිතයේදී පරිභෝජන වියදම හා සමතුලිත ජාතික ආදායමේ වටිනාකම කොපමණද?

| | පරිභෝජන වියදම (රු.මි) | සමතුලිත ජාතික ආදායම (රු.මි) |
|---|---|---|
| (i) | 1200 | 1500 |
| (ii) | 2400 | 3000 |
| (iii) | 750 | 1500 |
| (iv) | 1250 | 2500 |
| (v) | 2000 | 3000 |

47. පහත සඳහන් දෑ අතුරින් සමාහාර ඉල්ලුම ඉහල යාමට හේතු වන්නේ,

(i) ඉතුරුම් ඉහල යාමක්
(ii) පොළී අනුපාතිකයේ ඉහළ යාමක්
(iii) අපනයන ආදායමේ ඉහළ යාමක්
(iv) ආනයන වියදමේ ඉහළ යාමක්
(v) රජයේ බදු ආදායම ඉහළ යාමක්

48. සංවෘත ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත තොරතුරු සපයා ඇත

$C = 180 + 0.6yd$ $\quad T = 20$
$I = 100$ $\quad TR = 5$

බදු හා සංක්‍රාම ගැලපූ පසු නිවැරදි පරිභෝජන ශ්‍රිතය වනුයේ

(i) $C = 170 + 0.6yd$
(ii) $C = 165 + 0.6y$
(iii) $C = 171 + 0.6y$
(iv) $C = 171 + 0.6yd$
(v) $C = 180 + 0.6yd$

49. සරල ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 100 + 0.75Y$ ලෙස දී ඇත. මෙම ආර්ථිකයේ සමතුලිත නිමවුම (Y) රු.මි. 500 ක් නම් ආයෝජන මට්ටම වන්නේ,

(i) රු.මි. 475 (ii) රු.මි. 375 (iii) රු.මි. 500 (iv) රු.මි. 25 (v) රු.මි. 35

50. සංවෘත ආර්ථිකයක පරිභෝජනය $C = 200 + 0.6Y$ නම් ආයෝජන ගුණකය නිවැරදිව ප්‍රකාශ වී ඇත්තේ,

(i) 0.25 (ii) 4 (iii) 2.5 (iv) 1.6 (v) 1.7